# දේශගුණික අභියෝග සඳහා මූල්‍ය අංශයේ සූදානම

**විමසුම**

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශගුණික අභියෝග සඳහා විසඳුම් සෙවීමේ දී, කිසියම් රටක් හෝ ආර්ථිකයක් විසින් දේශගුණික අවදානම කෙරෙහි භෞතික හා පරිවර්තනීය ස්වභාවයෙන් පවතින නිරාවරණය මැන බැලීම වැදගත් වේ. බරපතල තත්ත්වයේ දේශගුණික අවදානම් වලට පහසුවෙන් ලක් විය හැකි දියුණු වෙමින් පවත්නා කුඩා දිවයිනක් ලෙස මේ වන විට ශ්‍රී ලංකාව හඳුනාගෙන ඇත. එහි ජනගහනයෙන් මිලියන 19 කට පමණ 2050 වසර වන විට මධ්‍යස්ථ හෝ දැඩි දේශගුණික බලපෑම්වලට ලක් විය හැකි ස්ථානවල ජීවත් වීමට සිදු විය හැකි බවටත් ඒ අය අතරින් සෑම ශ්‍රී ලාංකිකයන් 10 දෙනෙකුගෙන් 6 දෙනෙකු ම විවිධාකාරයේ අවදානම්වලට ලක් විය හැකි බවටත් එක්සත් ජාතීන්ගේ දේශගුණික බලපෑම් තොරතුරු පත්‍රිකාව[1] මඟින් හෙළි කර ඇත. මීට අමතරව වර්ෂ 1993-2002 අතර දත්ත සලකා බැලීමේ දී  දත්ත මත පදනම් ව, GERMANWATCH[2] විසින් සම්පාදනය කරන ලද දේශගුණික අවදානම් දර්ශකයේ ශ්‍රේණිගත කිරීමට අනුව ශ්‍රී ලංකාව රටවල් 171 න් 59 වන ස්ථානය ලබාගෙන ඇති අතර, දේශගුණික විපර්යාසවලින් ඇති වන බලපෑම් සඳහා ක්‍රියාමාර්ග නොගතහොත්, 2050 වන විට ශ්‍රී ලංකාව වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.2 ක පහළ යාමක් පෙන්නුම් කරන බව ආසියානු සංවර්ධන බැංකුවේ[3] ඇස්තමේන්තු පෙන්වා දෙයි. කෙසේ වෙතත්, තිරසර මූල්‍යකරණය සඳහා මුදල් අංශයේ නිරාවරණය සියයට 1කට මදක් වැඩි අගයක් පෙන්නුම් කරන අතර එය ප්‍රධාන වශයෙන් දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කිරීමේ අංශයට පිළියම් සපයන පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ නියෝජනය දරන අතර අනුවර්තන මූල්‍යකරණයෙහි සැලකිය යුතු හිඩැසක් තවමත් ඉතිරිව පවතී.

## මහ බැංකුවේ කාර්යභාරය

දේශගුණික විපර්යාස අවම කිරීම සහ අනුවර්තන ක්‍රියාමාර්ග උපායමාර්ගික ව සකස් කිරීම සඳහා ජාතික මට්ටමේ මුලපිරීම් සිදු කළ යුතු වන අතර, ඕනෑම උග්‍ර හෝ බොහෝ කල් පැවති දේශගුණික සිදුවීමක භෞතික සහ/හෝ පරිවර්තනමය අවදානම්වලට ඔරොත්තු දීමට මූල්‍ය අංශයේ සූදානම සහතික කිරීම ද ඒ හා සමාන ව වැදගත් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය අංශය මෙහෙයවන නියාමකයා වශයෙන් දේශගුණික අවදානමට එරෙහි ව ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමේ දී ඉටු කළ යුතු කාර්යභාරය හඳුනාගෙන ඇත. මහ බැංකුවේ මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීම යන ද්විත්ව වගකීම, ඕනෑම අහිතකර දේශගුණික සිදුවීමක් හේතුවෙන් බලපෑමට ලක් විය හැකි ය. නිදසුනක් ලෙස, හදිසි ගංවතුරක් හෝ සුළි කුණාටුවක් හේතුවෙන් කෘෂිකාර්මික අස්වැන්න අහිමි වීම, රටේ පොදු මිල මට්ටම් මත සැපයුම් මඟින් ඇති කෙරෙන උද්ධමන පීඩනයකට තුඩු දිය හැකි අතර ඉන් මහ බැංකුවේ මිල ස්ථායීතා අරමුණට බලපෑම් ඇති විය හැකිය. ඒ සමඟ ම, වගා හානි වීමේ තත්ත්වයකින් පසු කෘෂිකාර්මික ප්‍රජාවට තම ණය වගකීම් පියවීමට අපොහොසත් වීම හේතුවෙන් අක්‍රීය ණය තොගය ඉහළ යෑමට හේතු විය හැකි අතර එමගින් මූල්‍ය ආයතනවලට ඉහළ ණය අවදානමක් ඇති වේ. නව ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ මූල්‍ය අන්තර්ගතභාවය මහ බැංකුවේ කාර්යභාරයක් ලෙස හඳුනාගෙන ඇති බැවින්, දේශගුණික විපර්යාසවලට අදාළ මූල්‍ය අංශයේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වලට අනුව, අවදානමට ලක්විය හැකි කණ්ඩායම් හඳුනා ගැනීම සහ සමාජ සාධාරණත්වය සහතික කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ තවත් ප්‍රමුඛතාවයකි.

මූල්‍ය අංශයේ දේශගුණික/තිරසර මූල්‍යකරණය මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම  විශේෂයෙන් ම, මෙම විෂය පථය තුළ ගෝලීය අරමුදල් ආකර්ෂණය කර ගැනීම සඳහා වැදගත් පූර්ව අවශ්‍යතාවයක් වන, ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූල ව, යටිතල පහසුකම් සහ ප්‍රතිපත්ති රාමු විධිමත් කිරීම සඳහා වැඩි අවධානයක් අවශ්‍ය වන පසුබිමක් තුළ සාධාරණීකරණය කර ඇත. හරිත/දේශගුණික බැඳුම්කර, මිශ්‍ර මූල්‍යකරණය, සොබාදහම සඳහා ණය හුවමාරු ගිවිසුම්, දේශගුණික රක්ෂණය වැනි මූල්‍ය උපකරණ සහ මූල්‍ය ආයතන විසින් එළිදක්වනු ලබන නව්‍ය මූල්‍ය නිෂ්පාදන හේතුවෙන් සහ දේශගුණික අවදානම් පිළිබඳ ගැටලු ඉහළ යෑමත් සමග ගෝලීය මූල්‍ය වෙළඳපොළ පසුගිය දශකය තුළ සැලකිය යුතු ලෙස පුළුල් වී තිබේ. වෙළඳපොළ සහභාගීකරුවන් මෙන් ම, දේශගුණික/තිරසර මූල්‍යකරණයේ නියැලී සිටින ජාත්‍යන්තර පාර්ශ්ව විසින් දේශගුණික විපර්යාසවලට එරෙහිව සටන් කිරීම සඳහා NDCs[4] හෝ වෙනත් ජාතික උපාය මාර්ග මගින් නියම කර ඇති දේශගුණික කැපවීම් පිළිබිඹු කිරීම සඳහා මනා පරිචයන් අනුගමනය කිරීම සහ ප්‍රතිපත්ති රාමු වැඩිදියුණු කිරීම සඳහා ඉල්ලීම් කර ඇත.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තිමය මුලපිරීම්

ක්ෂේත්‍රය තුළට අරමුදල් සංචලනය කිරීම සඳහා අවශ්‍ය වන මූල්‍ය සම්පත් සැපයීම මගින් හරිත/ මූල්‍යකරණය සඳහා පහසුකම් සලසන අතර ම, මුදල් අංශයේ පාර්ශ්වකරුවන් අතර ප්‍රතිපත්ති ඒකාබද්ධතාව ඇති කිරීමේ මූලික අරමුණ ඇති ව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 වර්ෂයේ දී තිරසර මූල්‍යය සඳහා වන පෙර දැක්ම දියත් කරන ලදී. 2022 වසරේ දී එළිදක්වනු ලැබූ හරිත මූල්‍ය වර්ගීකරණය (GFT) ශ්‍රී ලංකාවේ මුදල් අංශය සඳහා වූ පළමු පෙර දැක්ම යටතේ ඇති ප්‍රධාන සන්ධිස්ථාන අතරින් එකක් වන අතර, එහි දී සංචාරක ව්‍යාපාරය මෙන්ම නීල ආර්ථිකය ඇතුළු ව, පුළුල් කර්මාන්ත ක්ෂේත්‍ර 08 ක් ආවරණය වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිති කර්මාන්ත වර්ගීකරණයට (ISIC) අනුකූල ව සංවර්ධනය කරන ලද 'හරිත' ලෙස හඳුනාගත යුතු ක්‍රියාකාරකම් වර්ගීකරණය කෙරිණි. යුරෝපය සහ චීනය අතර වර්ගීකරණයන් අනුකූල කළ තිරසර මූල්‍ය සඳහා වන ජාත්‍යන්තර වේදිකාවේ (IPSF) පොදු වර්ගීකරණය මත පදනම්ව GFT සංවර්ධනය කරන ලදී, වර්තමානයේ දී, GFT යනු මුදල් අංශය තුළ පමණක් නොව, බහුවිධ අංශ හරහා ජාතික මට්ටමින් පුළුල් ලෙස වර්ගීකරණයක් වශයෙන් හඳුන්වනු ලබන අතර, එය අදාළ පාර්ශ්වකරුවන් විසින් ගනු ලබන උත්සාහයන් අවතක්සේරු කළ හැකි 'හරිත සේදීම' වළක්වා ගැනීම සඳහා ඉතා වැදගත් පූර්ව අවශ්‍යතාවයකි. වර්ගීකරණයෙන් පසු ව, ශ්‍රී ලංකා මහ බැංකුව අභ්‍යන්තර අවදානම් කළමනාකරණ රාමු පිහිටු වීම සහ හරිත ක්‍රියාකාරකම් සඳහා සපයා ඇති පහසුකම් වාර්තා කිරීමට බැංකු සඳහා විධානයක් සහ බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා ඒ හා සමාන මාර්ගෝපදේශ මගින් මුදල් අංශය වෙත මාර්ගෝපදේශයක් නිකුත් කළේ ය.

තිරසර මූල්‍යකරණය සඳහා ගෝලීය වේදිකා/ජාලවල සාමාජිකයෙකු ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් අංශයේ පාර්ශ්වකරුවන්, නියාමන ආයතන මෙන් ම, පෞද්ගලික අංශයේ වාණිජ මණ්ඩල වැනි හරිත මූල්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලී සිටින අනෙකුත් පාර්ශ්වකාර කණ්ඩායම් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ සැසි සංවිධානය කිරීමෙන් ධාරිතා සංවර්ධනය සඳහා කටයුතු කරන ලදී. එමෙන් ම, ශ්‍රී ලංකා මහ බැංකුව රටේ දේශගුණික විපර්යාස වලට අදාලව ප්‍රතිපත්ති සකස් කිරීමේ දී සහ අරමුදල් සැපයීම සඳහා ඇති විභව, මූල්‍ය උපකරණ සහ අවස්ථාවන් පිළිබඳ ව පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ දී, ජාතික මට්ටමේ සහ කර්මාන්ත මට්ටමේ දැනුම බෙදාගැනීම්, ප්‍රතිපත්ති සංවාද යන දෙයාකාරයේ කර්තව්‍යයන් සඳහා ද මැදිහත් වේ.

## වත්මන් අභියෝග

UNFCCC[5] විසින් අවදානමට ලක්විය හැකි රටවල් සඳහා අලාභ සහ හානි අරමුදල සහ COP[6] හි කාබන් වෙළඳපොළ පිළිබඳ ගිවිසුමක් පිහිටුවා ඇති වර්තමාන පසුබිම තුළ, දේශගුණික විපර්යාස බලපෑම්වලට ගොදුරු විය හැකි සංවර්ධනය වෙමින් පවතින රටවල් දේශගුණික මූල්‍යකරණ උපායමාර්ගිකකරණයේ දී නව අභියෝගවලට මුහුණ දී තිබේ. විශේෂයෙන් 'හරිත ගිවිසුම' යටතේ යුරෝපීය සංගමය විසින් පනවන ලද දැඩි දේශගුණික රෙගුලාසි සමග, එවැනි වෙළඳපොළ සඳහා අපනයනකරුවෙකු ලෙස ශ්‍රී ලංකාව විසින් පාරිසරික පද්ධති සහ කාබන් විමෝචනය සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රමිතීන්ට සැලකිය යුතු වැඩිදියුණු කිරීම් සිදු කළ යුතු වන අතර ජාත්‍යන්තර වාර්තාකරණ ප්‍රමිතීන්ට (IFRS S1 සහ S2) අනුකූල වීම වඩාත් වැදගත් වේ. මූල්‍ය අංශය සඳහා පරිවර්තනමය මූල්‍යකරණ අවස්ථා සහ එවැනි ව්‍යාපෘති සඳහා අරමුදල් රැස්කිරීමේ නව අභියෝග සඳහා බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන අංශවල අවධානය අවශ්‍ය විය හැකි ය. තව ද, රජය විසින් මුහුණ දෙනු ලබන මූල්‍ය සීමාවන් සැලකිල්ලට ගෙන, රජය විසින් මූල්‍ය අංශයේ කොටස්කරුවන් සමග හවුල්කාරිත්වයෙන් අනාගතයේ දී සිදු කළ හැකි ඕනෑම මූල්‍යකරණ අවස්ථා සොයා බැලිය යුතු ය. ශ්‍රී ලංකාව විසින් ණය ගෙවීම තාවකාලික ව අත්හිටු වීමේ තත්ත්වයන්ගෙන් මිදෙන විට, ස්වභාවධර්මය සඳහා ණය හුවමාරු වැනි සංකීර්ණ ස්වෛරී ණය කළමනාකරණ විකල්ප පිළිබඳ සංවාදයක් මතු විය හැකි වුවද, එවැනි කැපවීම් සඳහා රටේ සූදානම, විශේෂයෙන් ම, අවශ්‍ය තාක්ෂණික විශේෂඥතාව අනුව තක්සේරු කළ යුතු ය. ප්‍රතිපත්තිමය මට්ටමින් සහ ආයතනික මට්ටමින් දේශගුණික මූල්‍යකරණ ක්ෂේත්‍රයේ ධාරිතා සංවර්ධනය අභියෝගයක් ලෙස පවතින අතර, දේශගුණික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී බහුවිධ පාර්ශ්වකරුවන් විසින් භාවිතා කිරීම සඳහා ශක්තිමත් දත්ත සමුදායක් තිබීම පිළිබඳ ව ද කාලෝචිත අවධානයක් අවශ්‍ය වන අතර ඒ සඳහා අන්තර් නියෝජිත ආයතන සම්බන්ධීකරණයක් අවශ්‍ය වේ.

## ඉදිරි ගමන්මග

ඉදිරි වසර පහ තුළ තිරසර සංවර්ධනය සඳහා අරමුදල් සැපයීමට මූල්‍ය අංශයේ අවධානය ශක්තිමත් කිරීම මෙන් ම, ESG අවදානම් කළමනාකරණය සලකා බැලීමෙන් මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමේ අරමුණ ඇති ව, පළමු පෙර දැක්මේ දක්වා ඇති කාර්යයන්ගෙන් බහුතරයක් සම්පූර්ණ කිරීමෙන් පසු, ගෝලීය ප්‍රවණතා සහ දේශීය වෙළඳපොළ ඉල්ලීම් සපුරාලමින්, ශ්‍රී ලංකා මහ බැංකුව යුරෝපා සංගමය සමග හවුල්කාරිත්වයෙන් IFC[7] හි තාක්ෂණික සහ මූල්‍ය සහාය ඇති ව තිරසර මූල්‍ය පෙර දැක්ම 2.0 (RM 2.0) සංවර්ධනය කළේය. ගෝලීය මනා පරිචයන්ට අනුකූල ව වාර්තා කිරීමේ සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා විධිමත් කිරීමට ද ඉන් අපේක්ෂා කෙරේ. මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම මගින්, විශේෂයෙන් ම, අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශ සම්බන්ධයෙන්, තිරසරභාවයේ සමාජීය පැතිකඩ සඳහා පිළියම් යෙදීමට RM 2.0 හි විෂය පථය පුළුල් කර ඇත. RM 2.0 හි ප්‍රධාන ප්‍රමුඛතා ක්ෂේත්‍රවල ක්‍රියාකාරී කණ්ඩායම් පිහිටුවීම මගින් ඨතඹ සඳහා අවශ්‍ය යාවත්කාලීන කිරීම් සමග සමාජ ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමට සහ අන්තර් ආයතන සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමට ද මහ බැංකුව අපේක්ෂා කරයි. කෙසේ වෙතත්, දේශගුණික අභියෝග සඳහා මුදල් අංශයේ සූදානම සඳහා බහුවිධ පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් අතර හැකියාවන් ගොඩනැගීම සහ දැනුම සහ දැනුවත්භාවය බෙදා ගැනීමට අවශ්‍ය වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, IFC, යුරෝපීය කොමිසම වැනි ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් සමග හවුල්කාරිත්වයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, ESG අවදානම් කළමනාකරණය, තිරසාර/දේශගුණික මූල්‍යකරණය, වාර්තාකරණය සහ අනාවරණය කිරීමේ අවශ්‍යතා ඉලක්ක කරගත් ධාරිතා සංවර්ධන වැඩසටහන් මාලාවක් පැවැත්වීමට අපේක්ෂා කරයි. කෙසේ වෙතත්, මෙම මුලපිරීම්වල අවසාන සාර්ථකත්වය රඳා පවතින්නේ දේශගුණික විපර්යාසවලට එරෙහිව සටන් කිරීමේ ජාතික උපාය මාර්ග ඉටු කර ගැනීම මත වන අතර එමගින් රටේ ඉල්ලුම්-පාර්ශ්වික සූදානම ඉහළ නැංවීම අරමුණු කරගත් අවශ්‍ය ප්‍රතිසංස්කරණ ගෙන ඒම සඳහා ජාතික මුලපිරීම් සිදු කළ යුතු වේ.


**ආශ්‍රේය ග්‍රන්ථ**

1 https://srilanka.un.org/sites/default/files/2023-12/UN%20Sri%20Lanka%20Climate%20Change%20Fact%20Sheet%20%282%29_0.pdf

2 Adil, L.; Eckstein, D.; Kuenzel, V.; Schaefer, L.: Climate Risk Index 2025 – Who suffers most from extreme weather events? Available at: http://www.germanwatch.org/en/93013

3 Ahmed, M., and S. Suphachalasai. 2014. Assessing the Costs of Climate Change and Adaptation in South Asia. Asian Development Bank. http://hdl.handle.net/11540/46. License: CC BY 3.0 IGO

4 ජාතිකමය වශයෙන් තීරණය කරන ලද දායකත්වයන්: https://env.gov.lk/web/images/pdf/policies/Final_NDC_IP_-_10072023.pdf

5 දේශගුණික විපර්යාස පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය

6 පාර්ශ්වයන්ගේ සමුළුව (එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුව)

7 ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව